# “සුපිළිපන් බව වැඩිදියුණු කරමු – අල්ලස හා දූෂණය පිටුදකිමු”

## උතුරු මැද පළාත් ඩිජිටල් නිර්මාණ තරඟාවලිය - 2026

## තරගය සඳහා යෝජිත අංශ සහ නිර්ණායක

### තරගය සඳහා යෝජිත අංශ

තරුණ තරුණියන්ට තමන්ගේ දක්ෂතාව අනුව තරග කළ හැකි පරිදි පහත අංශ පහ යෝජිත වේ.

**01. ඩිජිටල් කෙටි වීඩියෝ තරගය (Digital Short video competition)**

යෝජිත කාලය: තත්පර 30–90
මෙම කෙටි වීඩියෝ තරඟය තරඟ ඉසව් තුනකින් සමන්විත වේ.

- DSLR (Full HD 1920 x 1080) තාක්ෂණය යොදාගෙන සකස් කරන වීඩියෝ පට.
- Smart phone - සුහුරු ජංගම දුරකතන යොදාගෙන සිදු කරන වීඩියෝ පට.
- AI Creation Software - කෘතිම බුද්ධිය තාක්ෂණය යොදා ගනිමින් නිර්මාණය කරන වීඩියෝ පට.

අල්ලස ප්‍රතික්ෂේප කිරීම, අවංක රාජ්‍ය සේවය සහ දූෂණයෙන් තොර සමාජයක් පිළිබඳ වීඩියෝවක් නිර්මාණය කළ යුතු වේ.

**02. ඩිජිටල් පෝස්ටර් (Digital Poster Competition)**

අල්ලස හා දූෂණය වැළැක්වීම, සුපිළිපන් බව සහ මහජන වගකීම පිළිබඳ පණිවිඩයක් දෘශ්‍ය නිර්මාණයකින් ඉදිරිපත් කළ යුතුය.

**03. ඩිජිටල් සජීවිකරණ තරගය (Digital Animation Competition)**

කෙටි කාටූන්, සජීවිකරණ හෝ ඩිජිටල් කථාන්දර මඟින් සදාචාරාත්මක පණිවිඩයක් නිර්මානය කල යුතුය.

**04. සමාජ මාධ්‍ය ඩිජිටල් ප්‍රචාරණ තරගය (Social Media Digital Publicity Competition)**

අවංකභාවය සහ අල්ලස් විරෝධී ආකල්ප ප්‍රවර්ධනය සඳහා නිර්මාණාත්මක ඩිජිටල් ප්‍රචාරණ ව්‍යාපාරයක් සැලසුම් කිරීම සිදු කල යුතුය.

**05. ඩිජිටල් නවෝත්පාදක අදහස් තරගය (Digital Innovation Opinion Competition)**

අල්ලස හා දූෂණය අවම කිරීමට, රාජ්‍ය සේවාවල විනිවිදභාවය වැඩි කිරීමට හෝ මහජන පැමිණිලි පහසු කිරීමට තාක්ෂණික විසඳුම් යෝජනා කිරීම, මෙහිදි අපේක්ෂා කෙරේ.

## තරග අංශ අනුව අමතර නිර්ණායක

පොදු නිර්ණායකවලට අමතරව, අංශයට ගැළපෙන තාක්ෂණික ඇගයීමක්ද යොදාගැනේ.

| තරග අංශය | විශේෂයෙන් ඇගයීමට ලක්කළ යුතු කරුණු |
|---|---|
| ඩිජිටල් කෙටි වීඩියෝ | කථා ව්‍යුහය, රංගනය, කැමරාකරණය, සංස්කරණය සහ හඬපටය |
| ඩිජිටල් පෝස්ටර් | දෘශ්‍ය සංයෝජනය, වර්ණ භාවිතය, අකුරු කියවීමේ පහසුව සහ තොරතුරු පෙළගැස්ම |
| සජීවිකරණ කථාන්දර | චරිත හා දර්ශන අඛණ්ඩතාව, චලනය, කථා ඉදිරිපත් කිරීම සහ හඬ ගැළපීම |
| සමාජ මාධ්‍ය ප්‍රචාරණය | ඉලක්කගත අපේක්ෂකයා, පණිවිඩ අඛණ්ඩතාව, ප්‍රවේශ විය හැකි බව සහ ප්‍රචාරණ සැලැස්ම |
| ඩිජිටල් නවෝත්පාදක අදහස් | ගැටලුව හඳුනාගැනීම, විසඳුමේ ප්‍රායෝගිකත්වය, පරිශීලන පහසුව සහ ක්‍රියාත්මක කිරීමේ හැකියාව |

අභ්‍යන්තර කටයුතු ඒකකය,

ප්‍රධාන ලේකම් කාර්යාලය,

උතුරු මැද පළාත - අනුරාධපුර.

2026.10.19